දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

Distance and Continuing Education Unit - University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 ප්‍රථම වර පරීක්ෂණය - 2018 ජූලි/අගෝස්තු

Bachelor of Arts General (External) Degree Part II Regular Examination 2015 - July/August 2018

දේවිසා 3.2 - ජාත්‍යන්තර සම්බන්ධතා

PSG 3.2 - International Relations

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

නො පැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු විය හැකි ය

---

01. අන්තර්ජාතික දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා යොදා ගනු ලබන යතාර්ථවාදී ප්‍රවේශය සහ විඥානවාදී ප්‍රවේශය අතර කුමන වෙනස්කම් ඔබ හඳුනා ගන්නේ ද? විග්‍රහ කරන්න.

(ලකුණු 20 යි)

02. "ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන රඟුම්කරුවා ලෙස තවමත් කටයුතු කරන්නේ ජාතික රාජ්‍යයයි" ජාතික රාජ්‍යයේ මූලික ලක්ෂණවලට අවධාරණය යොමු කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

03. ජාතික බලය (National Power) අර්ථ කථනය කොට, එහි මූලාශ්‍රයන් පෙන්වා දෙන්න.

(ලකුණු 20 යි)

04. "ජාතික රාජ්‍යයන් විසින් සපුරාගත යුතු ජාතික ආශාවන් අතර ජාතික ආරක්ෂාව ප්‍රමුඛ වේ." පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

05. ජාත්‍යන්තර නීතිය (International Law) නිර්වචනය කොට, එහි මූලාශ්‍ර පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

06. "යුද්ධය" (The war) ලෝකයේ බලවත් ජාතීන් අතීතයේ සිට වර්තමානය දක්වා යම් යම් අවස්ථාවලදී භාවිතයට ගනු දැකිය හැකිය. ඉහත ප්‍රකාශය විමසන්න.

(ලකුණු 20 යි)

07. ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගැනීමේ මාධ්‍යයක් වශයෙන් ජාත්‍යන්තර සංවිධානවල භූමිකාව සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

08. "ලෝක සාමය, සහජීවනය, දිළිඳුකම පිටු දැකීම යනාදී කරුණුවලදී එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉටුකර ඇති කාර්ය භාරය සුවිශේෂී වේ." විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

09. "ජාත්‍යන්තර දේශපාලනයේ ක්‍රියාකාරිත්වයේ දී බහුජාතික සමාගම්වල ක්‍රියා කලාපය නිතර විවේචනය වේ." සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

10. පහත සඳහන් මාතෘකා <u>දෙකක්</u> (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. සාමූහික සුරක්ෂිතතාවය
II. ඇමරිකා එක්සත් ජනපදය හා උතුරු කොරියාව අතර වර්තමාන සබඳතා ස්වරූපය
III. දේශීය දේශපාලනය හා ජාත්‍යන්තර දේශපාලනය අතර වෙනස්කම්
IV. නිරායුධකරණය හා අවිපාලනය

(එක් කොටසකට ලකුණු 10 බැගින්)